# කාර්ය සාධන වාර්තාව

# செயல்திறன் அறிக்கை

# PERFORMANCE REPORT

# 2018

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

லலித் அதுலத்துமுதலி மகாபோலா உயர் கல்வி தவித்தொகை
அறக்கட்டளை நிதி

Lalith Athulathmudali Mahapola Higher Education Scholarship Trust Fund

# පටුන

| | පිටු අංක |
|---|---|
| මෙහෙයුම් සමාලෝචනය | 1-14 |
| විගණකාධිපති වාර්තාව | 15-22 |
| විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති නිරීක්ෂණ/ නිර්දේශ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය | 23-43 |
| උපායමාර්ගික සැලැස්ම 2020-2025 | 44-62 |

## 01. ශිෂ්‍යත්ව ප්‍රදානය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන පිරිස් අතර වාර්ෂිකව ප්‍රදානය කරන සීමිත මහපොළ ශිෂ්‍යත්ව කුසලතා ප්‍රමාණය අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව ප්‍රදානය කෙරේ. එහිදී ඉහළ ලකුණු ලබාගත් සිසුනට කුසලතාව පදනම් කරගෙන මහපොළ කුසලතා ශිෂ්‍යත්වද එතැන් සිට කුසලතාවයට ප්‍රමුඛත්වය දෙමින් පවුලේ ආදායම සැලකිල්ලට ගෙන මහපොළ සාමාන්‍ය ශිෂ්‍යත්වද පිරිනමනු ලැබේ. වාර්ෂිකව වෙන් කරන මුළු මහපොළ ශිෂ්‍යත්ව සංඛ්‍යාවෙන් 10% කුසලතා ශිෂ්‍යත්ව වන අතර ඉතිරි 90% සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා වෙන්කර ඇත . සාමාන්‍ය ශිෂ්‍යත්වයකට වඩා රු.50/- ක් කුසලතා ශිෂ්‍යත්වයක් සඳහා ගෙවනු ලැබේ.

මෙම වර්ෂයේදී 2017/18 අධ්‍යන වර්ෂය සඳහා 2017 අ.පො.ස.(උසස් පෙළ) ප්‍රතිපල මත විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් විශ්ව විද්‍යාල අධ්‍යාපනය පිණිස වර්ෂය තුල ඇතුලත් කල සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව 14,986 ක් ප්‍රදානය කිරීමට මහපොළ ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලය මඟින් අනුමැතිය ලබාදෙන ලදී. මෙකී සංඛ්‍යාවෙන් 1498 ක් පමණ දෙනෙකු කුසලතා පදනම මත ශිෂ්‍යත්ව ලැබූ අතර ඉතිරි ශිෂ්‍යත්ව 13,490 කුසලතා පදනම මත අඩු අදායම් ලබන පවුල්වල සිසුන් වෙත පිරිනමනු ලැබේ. විශ්ව විද්‍යාලවලට ප්‍රවේශිත මුළු සිසුන් සංඛ්‍යාව වන 28,000 සමඟ සංසන්දනය කිරීමේදී සිසුන්ගෙන් 53% ක් මෙම මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය යටතේ ආවරණය විය. මේ අනුව 2018 වර්ෂයේදි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් නිර්දේශිත පාඨමාලා සඳහා ඇතුලත් කල ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දෙන ලදි.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් නිර්දේශ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණයට අමතර වශයෙන් පහත සඳහන් අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි හා වෘත්තිය ඩිප්ලෝමා පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව 2051 ක් පිරිනැමීමට ක්‍රියාකර ඇත.

## මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය 2014 – 2018

| | විශ්වවිද්‍යාලය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| 1. | කොළඹ | 1,387 | 1,246 | 1,182 | 1,521 | 1,761 |
| 2. | පේරාදෙණිය | 1,615 | 1,381 | 1,318 | 1,452 | 1,757 |
| 3. | කැළණිය | 1,371 | 1,590 | 1,551 | 1,820 | 1,985 |
| 4. | ශ්‍රී ජයවර්ධනපුර | 1,810 | 1,859 | 1,894 | 2,029 | 2,288 |
| 5. | මොරටුව | 836 | 836 | 775 | 828 | 957 |
| 6. | යාපනය | 709 | 785 | 1,049 | 1,129 | 1,062 |
| 7. | යාපනය (රාමනාදන්) | 27 | 130 | 116 | 142 | 40 |
| 8. | රුහුණ | 667 | 1,015 | 907 | 1,009 | 1,098 |
| 9. | යාපනය - වවුනියා මණ්ඩපය | 48 | 104 | 124 | 109 | 90 |
| 10. | නැගෙනහිර | 285 | 340 | 583 | 633 | 402 |
| 11. | ගම්පහ වික්‍රමාරච්චි අයුර්වේද විද්‍යායතනය | 34 | 31 | 8 | 7 | 16 |
| 12. | දේශීය වෛද්‍ය විද්‍යායතනය | 79 | 68 | 66 | 73 | 93 |
| 13. | කොළඹ පරිගණක පාසැල | 90 | 69 | 83 | 94 | 131 |
| 14. | කොළඹ - ශ්‍රී පාලි | 32 | 92 | 69 | 99 | 63 |
| 15. | සෞන්දර්ය කලා | 187 | 348 | 330 | 330 | 242 |
| 16. | අග්නිදිග | 500 | 801 | 908 | 905 | 651 |
| 17. | රජරට | 561 | 609 | 673 | 814 | 779 |
| 18. | සබරගමුව | 339 | 546 | 535 | 556 | 540 |
| 19. | වයඹ | 360 | 358 | 509 | 574 | 683 |
| 20. | නැගෙනහිර-ත්‍රිකුණාමලය මණ්ඩපය | 72 | 109 | 127 | 118 | 135 |
| 21. | ඌව වෙල්ලස්ස | 101 | 167 | 229 | 251 | 175 |
| 22. | ස්වාමි විපුලානන්ද | 37 | 191 | 140 | 161 | 38 |
| | **මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව** | **11,147** | **12,675** | **13,176** | **14,654** | **14,986** |


මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයන් (අනෙකුත් ආයතන)

| | ආයතනය | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකා නීති විද්‍යාලය | 25 |
| 2. | ජාතික තාක්ෂණ ආයතනය, මොරටුව | 70 |
| 3. | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 26 |
| 4. | බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය | 20 |
| 5. | ජාතික සමාජ සංවර්ධන ආයතනය (උපාධි 10 ඩිප්ලෝමා 14) | 10 |
| 6. | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 1500 |
| 7. | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 400 |
| | එකතුව | **2051** |

**විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යත්වලාභීන් අතර සැසඳීම**


| වර්ෂය | **2014** | **2015** | **2016** | **2017** | **2018** |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලවලට ඇතුලත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 22,687 | 25,523 | 28,939 | 30,000 | 31,158 |
| ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 13,500 | 14,000 | 15,000 | 15,000 | 20,000 |
| මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව | 12,675 | 13,176 | 14,654 | 14,500 | 14,984 |
| ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 59% | 54% | 52% | 50% | 64% |
| මහාපොළ ලාභීන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 56% | 52% | 51% | 48% | 48% |
| ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ සිසුන් අතරින් මහපොළ ලැබූ සිසුන් | 94% | 94% | 97% | 96% | 75% |

**මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය 2014 – 2018**




## 02. ශිෂ්‍යත්ව ගෙවීම


මහපොළ ශිෂ්‍යත්වලාභියෙකුට එක අධ්‍යයන වර්ෂයකදී මසකට වාරිකය බැගින් ශිෂ්‍යත්ව වාරික 10 ක් ගෙවනු ලැබේ. ඒ අනුව , ශිෂ්‍යත්වය වෙනුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා මහා භාණ්ඩාගාරයෙන් මාසිකව සපයන රු.2,450/- ක් ද ඇතුළුව සෑම මහපොළ ශිෂ්‍යවත්වලාභියෙකුම පිළිවෙලින් කුසලතා ශිෂ්‍යත්ව සඳහා රු.5,050/- ක් ද සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා රු.5,000/- ක් ද විශ්ව විද්‍යාල මඟින් ලබාදෙනු ලැබේ.




**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම 2014 - 2018**

## ශිෂ්‍යත්ව ගෙවීම් කඩිනම් කිරීම උදෙසා සෘජු ගෙවීම් ක්‍රමය හඳුන්වාදීම


### පැරණි ගෙවීම් ක්‍රමය




විශ්වවිද්‍යාලය විසින් අත්සන් ලේඛණ භාවිතා කරමින් සිසුන්ගේ ගෙවීම් කටයුතු සිදුකරන ලදී. එහිදී ඉතා විශාල ප්‍රමාදයක් සිදුවිය. මාස 03 හෝ 04 ක් ප්‍රමාදවී වාරික සිසුන් වෙත ලබාදීම සිදුවිය.

මෙම ප්‍රමාදය වැලැක්වීම සඳහා ශිෂ්‍යත්ව වාරිකය සිසුන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුවම බැරකරන ක්‍රමයක් යෝජනා කොට මහාභාණ්ඩාගාරයේ එකඟතාවය මත 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලදී.

### නව ගෙවීම් ක්‍රමය




ඒ අනුව දැනට විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතන 22 සිසුන් 70,000 ක් සඳහා සෘජු බැංකු ගෙවීම් ක්‍රමය යටතේ ශිෂ්‍යත්ව වාරික ගෙවීම සිදු කරයි. ගෙවීම් සඳහා විශ්වවිද්‍යාල සෘජුවම මැදිහත් නොවන අතර මහපොළ අරමුදල විසින් මාසික වාරිකය රු.5,000/- හා රු.5,050/- සිසුන්ගේ ගිණුම්වලට බැර කරනු ලැබේ. මෙය ඉතා සාර්ථකව සිදුවන අතර කිසිදු ප්‍රමාදයකින් තොරව සිසුන්ට වාරික මුදල් නියමිත වේලාවට ලැබේ.

## මහපොළ ශිෂ්‍යත්ව සුදුසුකම් නිර්ණායක

### මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා සුදුසුකම් නිර්ණායක

ලලිත් ඇතුලත්මුදලි ශිෂ්‍යත්ව භාර අරමුදල කුසලතා ශිෂ්‍යත්ව සහ සාමාන්‍ය ශිෂ්‍යත්ව කාණ්ඩ දෙකක් යටතේ ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ.

1. **කුසලතා ශිෂ්‍යත්වය**

   අ.පො.ස.උසස් පෙළ විභාගයේදී සිසුන්ගේ කාර්ය සාධනය මත පදනම්ව කුසලතා කාණ්ඩය යටතේ සීමිත මහපොළ ශිෂ්‍යත්ව ප්‍රමාණයක් ප්‍රදානය කෙරේ.විභාගයෙන් ඉහළ ප්‍රතිපල ලබා ගන්නා සිසුන්ට මෙම කාණ්ඩය යටතේ ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ. ශිෂ්‍යත්ව වලින් 10% ක් කුසලතා ක්‍රමය යටතේ ලබා දෙනු ලබයි.

2. **සාමාන්‍ය ශිෂ්‍යත්වය**

   මහපොළ සාමාන්‍ය ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන්නේ ශිෂ්‍යයා ලබා ගන්නා දිස්ත්‍රික් කුසලතාවය ප්‍රමුඛතාවය දී පවුලේ ආදායම ද සැලකිල්ලට ගනිමිනි. මහපොළ ශිෂ්‍යත්වයේ මුළු සංඛ්‍යාවෙන් 90% ක්ම සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා වෙන් කර ඇත.

### මහපොළ ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් නිර්ණායක

පහත සඳහන් අවශ්‍යතා සපුරාලන සිසුන් ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලබති.

I. ශිෂ්‍යයා ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. ඔහු / ඇය විශ්ව විද්‍යාලයක හෝ විශ්ව විද්‍යාලයකට අනුබද්ධ ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි කළ යුතුය.

III. දෙමාපියන්ගේ ආදායම්

   a) මාපිය ආදායම 2017/18 සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂිකව රු. 500,000/- ට සමාන හෝ අඩු විය යුතුය.

   b) ඉහත ආදායම් සීමාව 2017/18 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වූ සිසුන්ට බලපැවැත්වෙනු ඇත. කෙසේ වෙතත්, මෙම චක්‍රලේඛයේ බලපැවැත්වෙන දිනට කිසිදු මූල්‍ය ආධාරයක් නොලැබෙන සිසුන්ට ඔවුන්ගේ දෙමාපියන්ගේ ආදායම සංශෝධිත සීමාවන් තුළට වැටෙන්නේ නම් මහපොළ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.


IV. මහපොළ සඳහා සිසුන් තෝරා ගැනීමේදී, සිසුන්ගේ දෙමව්පියන් නෛතිකව වෙන්වී ඇති අතර, එය සනාථ කිරීම සඳහා ලේඛණමය සාක්ෂි හෝ එකී වෙන් කිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයක් නොමැති නම්, ග්‍රාම නිලධාරී සහ අදාළ අංශයේ පොලිස් වාර්තා ලැබීමෙන් පසු ආදායම් සීමාව තීරණය කිරීම සලකා බැලිය යුතුය.

V. ශිෂ්‍යයා සේවයේ යොදවා ඇත්නම්, එම රැකියාවෙන් ලැබෙන ආදායම දෙමාපියන්ගේ ආදායමට එකතු කළ යුතුය.


   ශිෂ්‍යයා රැකියාවක නියුතු නම් හා විවාහක නම්, ශිෂ්‍යයා සහ කලත්‍රයා වෙනම පවුලක් ලෙස සැලකිය යුතු අතර, ඉහත (III) හි දක්වා ඇති නීති රීති අනුව මහපොළ සඳහා ඔහුගේ / ඇයගේ සුදුසුකම් අවතක්සේරු කරනු ලැබේ

## 2018.12.31 දිනට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලේ මූල්‍ය තත්වය

### ආයෝජන කළඹ




### ආයෝජන ආදායම - 2018



## මහපොළ භාරකාර අරමුදෙලෙහි අනෙකුත් ආයෝජන

### සංවර්ධන ලොතරැයි මණ්ඩලය (Development Lotteries Board)

මහපොළ භාර අරමුදලේ රු. මිලියන 2.2 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජනය කොට ඇති අතර ලොතරැයි මණ්ඩලයට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙක් ඇතුළත් වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් උපයන ආදායම ජනාධිපති අරමුදලට කෙලින්ම මාරු කරනු ලැබේ, ඉන්පසුව ලාභ කොටස ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරු කරනු ලැබේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩල 2014 - 2018 ලාභය හා ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරුකරන ලද ලාභ කොටස

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| | රු.(මි) | රු.(මි) | රු.(මි) | රු.(මි) | රු.(මි) |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ශුද්ධ ලාභය | 2016 | 1678 | 1836 | 507 | 2187 |
| මහපොළ භාරකාර අරමුදල වෙත මාරු කල කොටස | 898 | 736 | 767 | 25* | 804 |

* 2017 දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙවිය යුතු බදු වගකීම් සඳහා රුපියල් බිලියන 1.7 ක් ගෙවා ඇත. එම නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් අඩු විය. එබැවින් මහපොළ භාරකාර අරමුදල වෙත මාරු කර ඇත්තේ රුපියල් මිලියන 25 ක් පමණි.

### නැව්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL)

මහපොළ භාරකාර අරමුදලේ පූර්ණ හිමිකාරීත්වය යටතේ පවතින නැව්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL) හි රුපියල් මිලියන 200 ක් ආයෝජනය කරමින් සීමිත සමාගමක් ලෙස 2003 මාර්තු 23 වන දින සංස්ථාගත කරන ලදී. නැව්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් ආයෝජන කළමණාකරුවෙකු ලෙස කටයුතු කරන අතර මහපොළ භාරකාර අරමුදලෙහි ආයෝජන කළඹ කළමනාකරණය කරන්නේ අඩු අවදානමකින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමේ අභිප්‍රායෙනි. කැබිනට් මණ්ඩල අනුමැතියට අනුව 2018 වර්ෂයේදී නැව්වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් පාලනය කරන ලද මහපොළ අරමුදල ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ ඇති මහපොළ ප්‍රධාන ගිණුමට මාරුකරන ලද අතර 2019 පෙබරවාරි 28 වන දින සිට නැව්වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ තිබූ අරමුදල් කළමනාකරණ ගිවිසුම අවලංගු කරන ලදී.

## නැෂනල් වෙලත් සිකියුරිටීස් සමාගම (NWSL)

නැෂනල් වෙලත් සිකියුරිටීස් ලිමිටඩ් සමාගම 2003 ජුනි 23 වන දින සීමිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.මෙම සමාගම විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභා ආඥා පනත යටතේ මෙන්ම දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයන්ට අනුව ප්‍රාථමික ගැණුම්කරුවෙකු ලෙස කටයුතු කිරීම සඳහා ලියාපදිංචි කොට ඇත.

නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් 2004 දී තමන්ගේම අරමුදල් ආයෝජනය කරමින් නැෂනල් වෙලත් සිකියුරිටීස් සමාගම ආරම්භ කර ඇති අතර මෙම සමාගමේ කොටස් ප්‍රාග්ධනය සඳහා වන මුළු ආයෝජනය රු. මිලියන 300 ක් වන අතර එය 2018 අවසානය වන විට රුපියල් බිලියන 1 දක්වා වැඩි විය.

**2013 සිට 2018 දක්වා නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම සහ නැෂනල් වෙලත් සිකියුරිටීස් සමාගමෙහි මෙහෙයුම් ප්‍රතිපල**

| වර්ෂය | ලාභය/අලාභය | | මුළු එකතුව රු. (මි) |
|---|---|---|---|
| | නැට්වෙල්ත් කෝපරේෂන් රු.(මි) | නැෂනල් වෙලත් සිකියුරිටීස් රු.(මි) | |
| 2013 | (1.4) | 127.5 | 126.1 |
| 2014 | 60.9 | 516.6 | 577.5 |
| 2015 | 112.2 | (200.2) | (88.0) |
| 2016 | (65.8) | (499.2) | (564.9) |
| 2017 | 5.7 | 163.4 | 169.0 |
| 2018 | 8.9 | (242.5) | (233.5) |
| ශුද්ධ ප්‍රතිඵලය | **120.5** | **(134.4)** | **(13.8)** |

2018 අගෝස්තු 23 වෙනි දින එවකට විෂය භාර අමාත්‍යවරයා වූ ගරු උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්‍ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව අනුව NWCL සමාගම සමඟ පැවති ආයෝජන කළමනාකරණ ගිවිසුම අහෝසි කිරීමටත් මහපොළ අරමුදල ලංකා බැංකු මහපොළ ගිණුමට මාරු කිරීමටත් NWSL සමාගම සුදුසු ගැනුම්කරුවෙකු තෝරාගෙන එම සමාගමේ කොටස් විකිණීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. ඒ අනුව NWSL හි කොටස් විකිණීමට අදාල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කොට ඇත.

## ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT)

කොළඹ දිස්ත්‍රික්කයේ මාලඹේ පිහිටි අක්කර 25ක ඉඩම තුල SLIIT නමින් තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ආයතනයක් ආරම්භ කිරීම සඳහා මහපොළ භාරකාර මණ්ඩලයේ භාරකරුවන් විසින් අවසර ලබා දෙන ලදී. එහි තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ශාස්ත්‍රපති උපාධි, ඩිප්ලෝමා සහ පාඨමාලා පවත්වනු ලබයි. මූලික අධියරේදී පහත පාඨමාලා යෝජනා කරන ලදී.

- විද්‍යාවේදී තොරතුරු තාක්ෂණ උපාධිය
- තොරතුරු තාක්ෂණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා
- විද්‍යාවේදී තොරතුරු තාක්ෂණ උපාධිය - පරිවර්තන පාඨමාලා
- තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ඩිප්ලෝමා
- තොරතුරු තාක්ෂණ අලෙවිකරණය ආශ්‍රිත ඩිප්ලෝමා
- සහතිකපත්‍ර මට්ටමේ කෙටිකාලීන පාඨමාලා

ඒ අනුව, තොරතුරු තාක්ෂණ ආයතනයට අවශ්‍ය යටිතල පහසුකම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා 1999 දී රු.මි. 500 ක් ආයෝජනය කිරීමට මහපොළ භාරකාර මණ්ඩලයේ භාරකරුවන් තීරණය කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස පිහිටුවන ලදී.

## අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය 2000 ජනවාරි කොල්ලුපිටියේ BOC මර්චන්ට් ටවර් ගොඩනැගිල්ලේදී සිසුන් 400 කගේ සහභාගීත්වයෙන් පිහිටුවන ලදී.

වර්තමානයේ එය උපාධි අපේක්ෂකයන්ට හා පශ්චාත් උපාධි අපේක්ෂකයන් 7000කට වඩා වැඩි පිරිසක් පාඨමාලාවන් සාර්ථකව නිම කරන අතර ජාත්‍යන්තර සිසුන්ද මේ සඳහා ඇතුලත් වී ඇත. 9000 කට අධික විද්‍යාර්ථයින් ව්‍යාපාර, පරිගණක හා ඉංජිනේරු පීඨයන්හි උපාධි ලබා ඇත.

තවදුරටත්, SLIIT විසින් ප්‍රමුඛ පෙළේ බහුජාතික සමාගම් හා ශ්‍රී ලාංකික ආයතන සඳහා කාර්මික සීමාවාසික පුහුණුව සඳහා සිසුන් යොමු කරනු ලබයි. එහිදී, ඔවුන්ගේ වෘත්තීය පුද්ගල විශේෂතා වර්ධනය කිරීම හා ඔවුන් ලබා ගන්නා දැනුම ප්‍රයෝගිකව භාවිතය සඳහා අවස්ථාව උදාකර දෙනු ලැබේ.

2015 වර්ෂයේදී SLIIT ආයතනය හා මහපොළ අරමුදල අතර බදු ගිවිසුමක් හා වත්කම් පැවරීමේ ගිවිසුමකට එළඹ ඇති අතර වාර්ෂිකව රු. මිලියන 20 ක් බදු කුලී වශයෙන් SLIIT ආයතනය මහපොළ අරමුදල වෙත ගෙවයි. මෙම ගිවිසුම සම්බන්ධව මහපොළ භාර අරමුදලේ නිසි අනුමැතිය ලැබී නොමැති බව දක්වෙන අතර ඒ සම්බන්ධව වංචා හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන පැවැත්වෙන අතර එම විමර්ශන 2018 දෙසැම්බර් වන විට අවසන් කොට නොතිබුණි.

## 2019 පළමු මස 06 ඇතුලත්වන කළමනාකරණ ගිණුම්
## 2019 ජුනි 30 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| ආදායම | සටහන් | 30.06.2019 | 30.06.2018 | වර්ධනය |
|---|---|---|---|---|
| | | රු. | රු. | |
| පොළී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | 1 | 358,345,357 | | 21% |
| | | | 296,552,771 | |
| පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | 2 | 18,134,052 | 7,157,882 | |
| පොළී ආදායම - වත්කම් පිටුබලය සහිත විශ්වාසය | 3 | 17,248,300 | 20,800,755 | |
| පොළී ආදායම - ස්ථාවර තැන්පතු | 4 | 119,987,950 | 32,348,746 | |
| පොළී ආදායම - ණයකර | 5 | 78,179,374 | 80,336,568 | |
| පොළී ආදායම - වාණිජ පත්‍ර | | - | 15,855,705 | |
| පොළී ආදායම - කෙටිකාලීන තැන්පතු | 6 | 27,714,313 | 18,944,020 | |
| ප්‍රාග්ධන ලාභ සාක්ෂාත් කර ගැනීම | | 1,973,079 | - | |
| **මුළු ආයෝජන ආදායම** | | **621,582,425** | **471,996,447** | **32%** |
| සෘජු වියදම් | | | | |
| කළමනාකරණ මුදල් - NWCL | | - | (14,805,079) | |
| භාරකාර ගාස්තු - ලංකා බැංකු ව (NWCL) | | - | (1,056,122) | |
| භාරකාර ගාස්තු - ලංකා බැංකු ව( MTF) | | (932,000) | - | |
| මූල්‍ය වියදම් - භාණ්ඩාගාර බැඳුම්කර අධිමිල | | (970,768) | (3,732,110) | |
| ලංකා බැංකු ණය පොළී වියදම | | (35,331,626) | - | |
| **ශුද්ධ ආයෝජන ආදායම** | | **584,348,031** | **452,403,136** | **29%** |
| **වෙනත් ආදායම්** | | | | |
| DLB ලාභ කොටස | | 500,782,697 | 293,735,280 | |
| SLIIT බදු කුලිය | | 10,000,000 | 10,000,000 | |
| වෙනත් ආදායම් | | 50,425 | 1,876,730 | |
| **මුළු වෙනත් ආදායම්** | | **510,833,122** | **305,612,010** | |
| **මුළු ආදායම** | | **1,095,181,153** | **758,015,146** | |
| **වියදම්** | | | | |
| ශිෂ්‍යත්ව ගෙවීම් | | (344,445,136) | (662,783,395) | |
| වේතන | | (7,174,260) | (6,352,755) | |
| වෙනත් පරිපාලන වියදම් | | (8,186,462) | (6,941,196) | |
| ක්ෂය | | (28,829,022) | (28,019,523) | |
| මුළු වියදම් | | **(388,634,880)** | **(704,096,869)** | |
| වියදම් ඉක්මවූ ශුද්ධ ආදායම | | **706,546,273** | **53,918,277** | |
| බදු පෙර ශුද්ධ ලාභය / අලාභය | | 706,546,273 | 53,918,277 | |
| ආදායම් බදු ප්‍රතිපාදන | | (98,916,478) | - | |
| | | **607,629,795** | **53,918,277** | |
| මුළු බදු පසු ආදායම | | **607,629,795** | **53,918,277** | |

## භාරකාර මණ්ඩල රැස්වීම්

භාරකාර මණ්ඩල රැස්වීම් වලදී ආයතනික මෙහෙයුම් හා ප්‍රතිඵල අනුමත කරගත් අයවැය හා අදාල ප්‍රමිතීන්ට සාපේක්ෂව ඉතා සූක්ෂම ලෙස නිරීක්ෂණය කිරීම හා අධීක්ෂණය කිරීම භාරකාර මණ්ඩලය විසින් සිදුකරනු ලබයි. මෙහිදී භාරකාර මණ්ඩලය සම්මත න්‍යාය පත්‍රයක් සහ අනෙකුත් සාකච්ඡා කල කාරණා කෙරෙහි අවධානය යොමු කරයි. සියලුම භාරකාර මණ්ඩල රැස්වීම් වාර්තා සභාපතිවරයා විසින් අනුමත කොට සහතික කරයි. භාරකාර මණ්ඩලය මාස 02 කට වරක් රැස්වන අතර, අවශ්‍යතා පැන නැඟුනවිට විශේෂ භාරකාර මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලබේ. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල දී පවත්වන ලද භාරකාර මණ්ඩල රැස්වීම් සහ භාරකරුවන්ගේ සහභාගී වූ තොරතුරු පහත පරිදි වේ.

| | භාරකරු/භාරකරුවන් | තනතුර | පැවැත්වූ රැස්වීම් ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 | 5 |
| 1 | ගරු ප්‍රියසාද් ඩෙප් මහතා | අග්‍රවිනිශ්චයකාරතුමා | √ | √ | √ | √ | √ |
| 2 | ගරු මලික් සමරවික්‍රම මහතා | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය | √ | --- | -- | --- | -- |
| 3 | ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා | උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය | -- | √ | √ | √ | √ |
| 4 | චාන්දනී විජේවර්ධන මහත්මිය | ලේකම්, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | √ | --- | -- | --- | -- |
| 5 | ජේ.ජේ.රත්නසිරි මහතා | ලේකම්, උසස් අධ්‍යාපන හා සංස්කෘතික හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | -- | √ | √ | √ | √ |
| 6 | ඩී.ඩී.දිසානායක මහතා | ලේකම්, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | √ | --- | -- | --- | -- |
| 7 | එස්.එස්.හෙට්ටිආරච්චි මහතා | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය | √ | √ | -- | -- | -- |
| 8 | එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර | පත්කල භාරකරු | | √ | √ | √ | √ |
| 9 | ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා | පත්කල භාරකරු | √ | --- | -- | --- | -- |
| 10 | වෛද්‍ය ඩී.කේ.ඩී.මැතිව්ස් මහතා | පත්කල භාරකරු | | √ | √ | √ | √ |
| 11 | නීතිඥ අනිල් රාජකරුණා මහතා | පත්කල භාරකරු | √ | --- | -- | --- | -- |


√ - සහභාගී වූ රැස්වීම් ගනන

---- - භාරකාර මණ්ඩලයෙන් ඉවත් වී ඇත.

## භාරකාර මණ්ඩල සතු කමිටු

1. කළමනාකරණ හා විගණන කමිටුව
2. ආයෝජන කමිටුව
3. ටෙන්ඩර් මණ්ඩල කමිටුව
4. සේවක සුභ සාධක මණ්ඩල කමිටුව

## ආයතනික ව්‍යුහය


භාරකාර මණ්ඩලය
පාලක/අධ්‍යක්‍ෂ (භාරකාර මණ්ඩලය විසින් පත් කරන ලද)
අධ්‍යක්ෂ (ආයෝජන) (1)
අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) (1)
කළමනාකරු/ නි.අ (ව්‍යාපෘති) (1)
සහකාර අධ්‍යක්ෂ /නි.අ (මූල්‍ය) (1)
සහකාර අධ්‍යක්ෂ/නි.අ (පරිපාලන) (1)
අභ්‍යන්තර විගණක (1)
කණිෂ්ඨ කළමනාකරු (1)
කණිෂ්ඨ කළමනාකරු (1)
කළමනාකරණ සහකාර (3)
කළමනාකරණ සහකාර (7)
පොත් තබන්නා (1)
කළමනාකරණ සහකාර (3)
විගණන නිලධාරීන් (3)
රියදුරු (1)
කාර්යාල කාර්ය සහායක (1)
කාර්යාල කාර්ය සහායක (1)
කාර්යාල කාර්ය සහායක (1)
කාර්යාල කාර්ය සහායක (1)

## කාර්යය මණ්ඩලය

| සේවා ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 1 | 1 | |
| ද්විතීය | 6 | 2 | 4 |
| තෘතීය | 19 | 8 | 11 |
| ප්‍රමුඛ | 5 | 2 | 3 |
| එකතුව | 31 | 13 | 18 |

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල අවම කාර්යය මණ්ඩල පිරිවැයක් දරණ ආයතනයක් ලෙස එහි ආරම්භයේ සිටම ඉතා සීමිත කාර්යය මණ්ඩලයක් මගින් කටයුතු කරන අතර කාර්යය මණ්ඩල පරිපාලන වියදම ආදායමෙන් 0.26% ක් වූ අතර වියදමින් 0.40% වැනි ඉතා අවම මට්ටමක තබා ගත හැකි විය.

කාර්යය මණ්ඩලයෙහි දැනට පවතින ඇබෑර්තු අභ්‍යන්තර උසස් කිරීම් මගින් පිරවීමටත් ඉන්පසු ඇතිවන තනතුරු සඳහා ඇබෑර්තු බාහිර අයදුම්කරුවන්ගෙන් පිරවීමටත් භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.

# විගණකාධිපති වාර්තාව

මගේ අංකය / எனது இல. / My No. TCM2/F/MTF/6/18/14 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2019 ඔක්තෝබර් 31 දින

සභාපති
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි 4.1.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වත්කම් එහි ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීරණ ආදායමක් හරහා සාධාරණ වටිනාකම, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම යනාදී වශයෙන් වර්ගකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් වටිනාකම රු.10,232,401,250 ක් වූ මූල්‍ය වත්කම් එසේ දක්වා නොතිබුණි.

### (ආ) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2005 වර්ෂයේදී වටිනාකම රු.12,460,179 කට ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලබේ පිහිටි අක්කර 25 ක ඉඩම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සමඟ කල්බදු පදනම යටතේ ගිවිසුමකට එළඹ තිබූ අතර, සමාලෝචිත වර්ෂය වන විටත් එම ඉඩම වර්තමාන වටිනාකමට අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(iii) භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ක්ෂය ප්‍රතිපත්තිය අනුව දේපළ, පිරියත හා උපකරණ එම වත්කම ප්‍රයෝජනයට ගැනීම ආරම්භ කළ දිනයේ සිට ක්ෂය කළ යුතු වුවත් 2018 වර්ෂය තුළ මිලදී ගත් පිරියත හා උපකරණ මිලදී ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර තිබීම නිසා රු.181,457 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයට අදාල වෛද්‍ය හා හදිසි අනතුරු රක්ෂණ වියදම රු.87,500 ක් වුවද, ඉදිරියට කළ ගෙවීම රු.360,572 ඇතුළත් සමාලෝචිත වර්ෂයේ වියදම රු.448,072 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(v) සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 (1) (ආ) වගන්තිය ප්‍රකාරව මහපොළ භාර අරමුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවීමේදී සිදුකර තිබූ ආයෝජන ප්‍රතිශතයට අනුපාතික අතිරික්තය ප්‍රේෂණය කළ යුතුයි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ අතිරික්තයෙන් අරමුදලට හිමි කොටස රු. 1,093,798,978 ක් වුවද එය රු. 189,198,591 ක් අඩුවෙන් රු. 904,600,387 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවලද දක්වා තිබුණි.

(vi) 2012 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අතිරික්තයෙන් භාර අරමුදලට ලැබිය යුතුව තිබූ නමුත්, ජනාධිපති අරමුදල විසින් එවා නොතිබූ රු.835,766,892 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ආ) ඡේදයේ (1) සහ (V) යටතේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව භාර අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට භාර අරමුදලට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2019 ජූලි 31 දිනදීය |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු.3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිවෙකු ඉල්ලුම් කර නොමැති බැවින් එය නිශ්චිතව ම ගෙවිය යුතු බවට හඳුනා ගත නොහැකි වී තිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සෑම ප්‍රසම්පාදන අස්තිත්වයක් විසින්ම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු අතර එහි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් අරමුදල විසින් ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරිත්වය සමාලෝචනය

(i) අධ්‍යාපනය සැලසීමේ නිරත වන පාසල්, ආයතන, පදනම් සහ එවැනි ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම, වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි වෘත්තීය අභ්‍යාස, ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහයවීම, අධ්‍යාපනය සැලසීමේ නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලැසීම යන භාර අරමුදල් පනතේ 6.1 වගන්තියේ සඳහන් අරමුණු ඉටුකිරීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් අවධානය යොමුකර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම (SLIIT) සමඟ 2005 නොවැම්බර් 14 සහ 2015 මැයි 12 දින එළඹි ගිවිසුම් සහ 2017 අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අනුමැතිය අනුව භාර අරමුදලට SLIIT ආයතනය සම්බන්ධයෙන් තිබූ අයිතිය අහිමි කර තිබුණි. තව ද 2015 එළඹි ගිවිසුම වැරදි බවට අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමේ හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිසම යටතේ විමර්ශන 2 ක් විභාග වෙමින් පැවැති අතර 2019 ජූලි 12 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම්කාරක සභා රැස්වීමේ දී SLIIT ආයතනය සම්බන්ධයෙන්

ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සහ භාර අරමුදලේ සභාපති වෙත දන්වා තිබූ නමුත් මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2018 සැප්තැම්බර් 05 දිනැති අංක අමප/18/1873/824/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව භාර අරමුදල නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ එළඹි ආයෝජන කළමනාකරණ ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ අනුව 2019 පෙබරවාරි 28 දින නැෂනල් වෙල්ත් කෝපරේෂන් විසින් කළමනාකරණය කරන ලද ආයෝජන කළඹ ලංකා බැංකු ආයතනික ශාඛාවේ මහපොළ භාර අරමුදල සතු ප්‍රධාන ගිණුම වෙත මාරු කර තිබුණි. තවද එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඈවර කිරීම හා නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම විකිණීම සිදුකළ යුතු වුවත් මෙතෙක් එය සිදුකර නොතිබුණි.

(iv) ඉහත (iii) සඳහන් කටයුතු ක්‍රියාත්මක නොකර මහපොළ භාර අරමුදල විසින් ලංකා බැංකුවෙන් ලබාගත් රු.බිලියන 4 ක ණය පහසුකමක් මත ලබාගත් රු.බිලියන 1.111 ක ණය මුදලෙන් නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගමේ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් 2019 මාර්තු 26 දින මිල දී ගෙන නැවත එය 2019 මාර්තු 27 දින රු.බිලියන 1.113 කට විකුණා තිබූ අතර එම මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර 2019 ජුනි 27 දින එම ණය පියවා තිබුණි.

(v) භාර අරමුදල් පනතේ 6.2(අ) (ඇ) (ඈ) වගන්ති අනුව මුදල් සපයා ගැනීම සඳහා දේශීය හෝ විදේශීය මූලාශ්‍ර වලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන, තෑගී හෝ පරිත්‍යාග භාර ගැනීමට හා ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ලොතරැයි පැවැත්වීමට බලය භාර අරමුදලට ලැබී තිබුණි. එසේ වුවද එවැනි මූලාශ්‍ර මඟින් අරමුදල් සපයා ගැනීමට කටයුතු නොකර විශ්ව විද්‍යාල සිසුන් සඳහා ලබා දෙනු ලබන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වය සඳහා ආරම්භයේ දී සම්පූර්ණ දායකය මහපොළ භාර අරමුදලින් සිදුකළ ද පසුකාලීනව දායකත්වයෙන් සියයට 49 ක් රජය විසින් ලබාදීමට කටයුතු කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

# විගණන පිළිතුරු

## 1.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

ඇමුණුම් අංක 1

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග හා වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 අනුව මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීරණ ආදායමක් හරහා සාධාරණ වටිනාකම, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම යනාදී වශයෙන් වර්ගකර මූල්‍ය තත්ත්ව විස්තරයේ දැක්විය යුතු වුවත් වටිනාකම රු.10,232,401,250 ක් වූ මූල්‍ය වත්කම් එසේ දක්වා නොතිබුණි. | පවත්නා | පද්ධතිය හඳුන්වා දිය යුතුය | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව ගිණුම් පිළියෙල කළ යුතුය. | 2019 වර්ෂයේ ගිණුම් කටයුතු ආරම්භ කර ඇති අතර එම ගිණුම් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිකරණය අනුව පිළියෙල කරනු ලැබේ. |

### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග හා වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 3.1.6 ක්ෂය ප්‍රතිපත්තිය යටතේ දක්වා ඇති පරිදි දේපළ, පිරියත හා උපකරණ එම වත්කම ප්‍රයෝජනයට ගැනීම ආරම්භ කළ දිනයේ සිට ක්ෂය කළ යුතු වුවත් 2018 වර්ෂය තුළ මිලදී ගත් පිරියත හා උපකරණ මිලදී ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර තිබීම නිසා රු.181,457 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | 2018 වර්ෂය තුල මිලදී ගත් පිරියත හා උපකරණ වලට අදාල ක්ෂය අධි වෙන්කිරීම, රු.181,457 ක් නිවැරදි වන අතර එය 2019 වර්ෂයේ ගිණුම් වල ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුය. | 2019 වර්ෂයේ ගිණුම ආරම්භ කොට ඇති අතර ක්ෂය වෙන්කිරීම සම්බන්ධයෙන් නිවැරදි ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කරනු ලබයි. |

### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග හා වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාල වෛද්‍ය හා හදිසි අනතුරු රක්ෂණ වියදම රු.87,500 ක් වුවද ඉදිරියට කර තිබූ රු.360,572 ඇතුළත් මුළු ගෙවීම වූ රු.448,072 සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩි දියුණු කල යුතුය | වැරදීමකි. 2019 වර්ෂයේ දී නිවැරදි කරනු ලැබේ. | වර්ෂයට අදාල වියදම පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගත යුතුය. | 2019 වර්ෂයට අදාල වියදම් පමණක් ගිණුම්ගත කිරීම සිදුකොට ඇත. |
| (ආ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ගිණුම් අනුව භාර අරමුදලට හිමි ලාභ කොටස රු.1,093,798,978 ක් වුවද භාර අරමුදල එය නිවැරදි ව ගණන් බලා ගිණුම්ගත කර නොතිබූ අතර ඒ අනුව ලාභය රු.189,198,591 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි | පවත්නා | පවත්නා පද්ධතිය වැඩි දියුණු කල යුතුය | ජනාධිපති අරමුදලෙන් එවන ප්‍රකාශයේ සඳහන් අගය ගිණුම් ගත කෙරේ. | නිවැරදි අගය ගිණුම් ගත කල යුතු අතර මහපොළ භාර අරමුදලට හිමි කොටස ගණනය කිරීමේ පදනම නිශ්චිතව තීරණය කර ගත යුතු වේ. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් මහපොළ අරමුදලට ලැබිය යුතු නිශ්චිත ලාභ කොටස සංවර්ධන ලොතරැයි පනත මඟින් හෝ මහපොළ අරමුදලෙහි භාරකාර මණ්ඩල තීරණයක් හෝ දැනට නිශ්චිතව නොමැති අතර මෙ සම්බන්ධයෙන් ජනාධිපති අරමුදල සමඟ සාකච්ඡා කොට අවසන් එකඟතාවයක් ඇති කර ගැනීමට මහපොළ භාරකාර මණ්ඩල තීරණයක් ගෙන ඇත. ඒ අනුව ඉදිරියේදී එම එකඟතාවය ඇති කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදන අතර අවශ්‍ය වුවහොත් සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත සංශෝධනය කොට ලාභ කොටස බෙදීයන ආකාරය නිශ්චය කර ගැනීමට කටයුතු කරනු ඇත. |

### 1.3.4 අනුචිත ඇගැයීම් හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| රු.12,460,179 ක් ලෙස 2005 වර්ෂයේදී ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලබේ පිහිටි අක්කර 25 ක ඉඩම සමාලෝචිත වර්ෂය වන විටත් වර්තමාන අගයට පොත්වලට ගෙන නොතිබුණි. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය | ගිණුම් වල දැක්වෙන රු.12,460,179 ක මුදල මෙම ඉඩම මිලදී ගැනීමට යෙදවූ මුදල වන අතර 2015 මැයි 12 වන දින අත්සන් කරන ලද බදුකුලී ගිවිසුමට එළඹෙන අවස්ථාවේ මෙම ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරුවක් ලබාගෙන නොතිබුණි. එම බදු ගිවිසුම සම්බන්ධයෙන් 2018 අවසන් ගිණුම් පිළියෙළ කරන අවස්ථාව වන විටත් අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ හා ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ පරීක්ෂණ 2ක් ක්‍රියාත්මක වූ බැවින් හා SLIIT ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂික ගිණුම් හෝ වෙනත් කිසිම තොරතුරක් මහපොළ අරමුදලට ලබා නොදීම මත | SLIIT ආයතනය සමඟ ඉඩම සම්බන්ධයෙන් පවතින්නේ බදු කුලී ගිවිසුමකි. ඉඩමේ අයිතිය මහපොළ සතු බැවින් ඉඩම තක්සේරු කිරීමට හැකි බැවින් ඉඩම තක්සේරු කර වටිනාකම පොත්වලට ගැනීමට කටයුතු කල යුතුය. | ශ්‍රී ලංකා තොරතුරු තාක්‍ෂණ ආයතනය සම්බන්ධයෙන් ඇති බදු ගිවිසුම හා අයිතිය පැවරීමේ ගිවිසුම මහපොළ භාර අරමුදලේ අනුමැතියෙන් තොරව වංචා සහගත ලෙස සිදු කොට ඇති බව අනාවරණය වීම හේතුවෙන් අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිෂන් සභාවේ පරීක්‍ෂණ ආරම්භ කොට මේ වන විට අවසන් වාර්තාව ජනාධිපතිවරයා වෙත භාරදී ඇති බව දැන ගන්නට ඇති අතර එම අවසන් වාර්තාව අතිගරු ජනාධිපතිවරයා විසින් නීතිපතිවරයා වෙත යොමු කිරීමට නියමිතය. ඒ අනුව නීතිපතිවරයාගේ උපදෙස් මත මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නියමිතය. දැනට ඉහත ගිවිසුම් මඟින් මහපොළ අරමුදල භාරකරුවන්ට හෝ වෙනත් කිසිම අයෙකුට එම පරිශ්‍රයට |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | එම ඉඩම තක්සේරු කිරීමට නොහැකිවී ඇත. ඉදිරියේදී SLIIT ආයතනයේ අයිතිය නිරවුල් වූ වහාම රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාවක් ලබාගෙන අදාල අගයන් පොත්වලට ගැනීමට කටයුතු කරනු ඇත. | | ඇතුලුවීමේ හැකියාවද නොමැත. කෙසේ වෙතත් ඉඩම් තක්සේරු කිරීම සම්බන්ධයෙන් රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙත තක්සේරු වාර්තා ලබාදෙන ලෙස ඉල්ලීමක් භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ ඉදිරිපත් කිරීමට නියමිතය. |

### 1.3.5 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පවත්නා | පද්ධතිය හඳුන්වා දිය යුතුය | ඉදිරියේදී ඒකාබද්ධ ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනයට කඩිනමින් ඉදිරිපත් කල යුතුය. | මහපොළ භාරකාර අරමුදලේ සහ අනුබද්ධිත සමාගම්වල ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ E & Y සමාගමට ලබාදී ඇති අතර 2019 දෙසැම්බර් අවසන් වන විට අදාල ඒකාබද්ධ ගිණුම් කෙටුම්පත් ලබාදීමට එකඟ වී ඇත. ඒ අනුව 2019 වර්ෂයේ ඒකාබද්ධ ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. |

## 1.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.4.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| 2012 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ සංවර්ධන ලොතරැයි මණ්ඩල ලාභයෙන් භාර අරමුදලට ලැබිය යුතුව තිබූ නමුත් ජනාධිපති අරමුදල විසින් එවා නොතිබූ රු.735,066,766 ක ලාභ කොටස භාර අරමුදල විසින් ගිණුම්ගත කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | ජනාධිපති අරමුදල විසින් එවනු ලබන විස්තරයට අනුව ගිණුම්ගත කරනු ලැබේ. | මහපොළ භාර අරමුදලට ජනාධිපති අරමුදලින් එවන ලාභ කොටස තීරණය කිරීමේ නිශ්චිත පදනම ජනාධිපති අරමුදලින් ලිඛිතව ලබා ගැනීමට කටයුතු කල යුතුය. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් මහපොළ අරමුදලට ලැබිය යුතු නිශ්චිත ලාභ කොටස සංවර්ධන ලොතරැයි පනත මඟින් හෝ මහපොළ අරමුදලෙහි භාරකාර මණ්ඩල තීරණයක් හෝ දැනට නිශ්චිතව නොමැති අතර මෙ සම්බන්ධයෙන් ජනාධිපති අරමුදල සමඟ සාකච්ඡා කොට අවසන් එකඟතාවයක් ඇති කර ගැනීමට මහපොළ භාරකාර මණ්ඩල තීරණයක් ගෙන ඇත. ඒ අනුව ඉදිරියේදී එම එකඟතාවය ඇති කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදන අතර අවශ්‍ය වුවහොත් සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත සංශෝධනය කොට ලාභ කොටස බෙදීයන ආකාරය නිශ්චය කර ගැනීමට කටයුතු කරනු ඇත. |

## 1.4.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු.3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිවෙකු ඉල්ලුම් කර නොමැති බැවින් එය නිශ්චිතව ම ගෙවිය යුතු බවට හඳුනා ගත නොහැකි වී තිබුණි. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | මෙම ඉදිකිරීම් වලට අදාල ගෙවිය යුතු අවසන් ශේෂය මෙම වර්ෂයේ රු. 3,832,875 ක් ලෙස අරමුදලේ ගිණුම් වල දක්වා තිබුනත් මෙම ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් මේ වනතෙක් ස.තො.ස. ආයතනය යටතේ තිබූ සමාගම හෝ වෙනත් කොන්ත්‍රාත්කරුවෙක් ඉදිරිපත් වී නොමැත.ඒ අනුව, මෙය නිශ්චිත වශයෙන්ම ගෙවිය යුතු මුදලක්ද යන්න හඳුනාගත නොහැක. ඒ සම්බන්ධයෙන් වාර්තාවක් 2019 වර්ෂයේ ගිණුම් සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ගෙවිය යුතු ද යන්න අදාල ආයතනවලින් විමසීම කර නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | මහපොළ අරමුදල යටතේ පිහිටුවා තිබූ පාසැල් සංවර්ධන අරමුදල යටතේ සිදුකරන ලද ඉදිකිරීම් සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට ඇති මුදල ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණද මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම් නිර්දේශ සතොස ආයතනය යටතේ පිහිටුවා තිබූ සමාගමක් මඟින් සිදුකොට තිබූ අතර දැනට එම සමාගමේ කටයුතු ක්‍රියාත්මක නොවේ. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවී ඇත. කෙසේ හෝ මෙම ගෙවිය යුතු ශේෂය නිරවුල් කිරීම සඳහා මහපොළ අරමුදල තවදුරටත් ක්‍රියා කරනු ලැබේ. |

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| (අ) අධ්‍යාපනය සැලසීමෙ නිරත වන පාසල්, ආයතන, පදනම් සහ එවැනි ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම, වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි වෘත්තීය අභ්‍යාස, ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහයවීම, අධ්‍යාපනය සැලසීමේ නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලැසීම යන භාර අරමුදල් පනතේ 6.1 වගන්තියේ සඳහන් අරමුණු ඉටුකිරීම කෙරෙහි | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කල යුතුය. | ඒ සම්බන්ධව ඉදිරියේ දී කටයුතු කිරීමට අදහස් කෙරේ. | පනතේ සඳහන් මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුය. | (අ) මහපොළ අරමුදලේ ස්ථාපිත අරමුණු ඉටුකර ගැනීම සඳහා මහපොළ භාර අරමුදල එහි භාරකරුවන් නිතරම කටයුතු කරන අතර විශ්ව විද්‍යාල සඳහා වාර්ෂිකව බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව පසුගිය වර්ෂ කිහිපය තුල කැපී පෙනෙන ලෙස ඉහළ නංවා ඇත. ඒ අනුව මහපොළ අරමුදල මඟින් ලබාදෙන ශිෂ්‍යත්ව ප්‍රමාණයද එයට සාපේක්ෂව වැඩි කිරීම සිදුවී ඇත. ඒ අනුව අරමුදලේ වර්තමාන ආදායම් තත්වය අනුව ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා අතිරේකව රු.මිලියන 400 ක පමණ මුදලක් වැඩි වී ඇත. එසේම 2015 සිට 2019 ගෙවීම් කාලච්ඡේදය තුල ශිෂ්‍යත්වයක වටිනාකම වැඩි කොට ඇත. විශේෂයෙන් 2019 වර්ෂයේ කාර්මික විද්‍යාලවල සිසුන් සඳහා මාසික ශිෂ්‍යත්ව වාරිකය රු.1,500/- සිට 2500/- වැඩි කිරීම නිසා ඒ සඳහා ද අතිරේක පිරිවැයක් දැරීමට සිදුවිය. එසේම මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල මැදිහත්ව පූර්ණ ආයෝජනයක් වන 1999 දී ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය පිහිටවූ |

| | | | | | |
|---|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් අවධානය යොමුකර නොතිබුණි. | | | | | අතර එමගින් ලැබිය යුතු මුදල් නොලැබී යාම තුල ඉදිරි ආයෝජන අවස්ථා අහිමි වී ඇති අතර ඉදිරියේදී නව ආයෝජන අවස්ථා හඳුන්වාදීම මගින් පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අරමුදල කටයුතු කරනු ඇත. |
| (ආ) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම (SLIIT) සමහ 2005 නොවැම්බර් 14 සහ 2015 මැයි 12 දින එළඹි ගිවිසුම් සහ 2017 අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කල කැබිනට් සංදේශය සඳහා ලද කැබිනට් තීරණය අනුව භාර අරමුදලට SLIIT ආයතනය සම්බන්ධයෙන් තිබූ අයිතිය අහිමි කර තිබුණි. තව ද 2015 එළඹි ගිවිසුම වැරදි බවට අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමේ හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිසම යටතේ විමර්ශන 2 ක් විභාග වෙමින් පැවැති අතර 2019 ජූලි 12 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම්කාරක සභා රැස්වීමේ දී එහි සභාපති විසින් SLIIT ආයතනය සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කල යුතුය. | කටයුතු කරමින් පවතී. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කල යුතුය. | (ආ) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සම්බන්ධයෙන් 2015 මැයි 12 දින ඇති කර ගන්නා ලද බදු ගිවිසුම හා වත්කම් පැවරීමේ ගිවිසුම නිසි භාරකාර මණ්ඩල අනුමැතියකින් තොරව සිදුකර ඇති බව අනාවරණය වීම යටතේ අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ පරීක්ෂණ පැවැත් වූ අතර එහි අවසන් වාර්තාව අතිගරු ජනාධිපතිතුමා විසින් ගරු නීතිපතිවරයා වෙත භාර දීමට නියමිතය. එම අවසන් වාර්තා නීතිපතිවරයාගේ නිරීක්ෂණ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා මහපොළ අරමුදල වෙත ලැබීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නියමිතය. මෙ සම්බන්ධයෙන් 2019.07.12 දින පැවති Cope කමිටුවේදී සාකච්ඡා කර ඇති අතර Cope කමිටුවේ නිර්දේශ මත මෙ ගිවිසුම් දෙක අවලංගු කිරීමටත් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය ආරම්භයේ දී පැවති කළමනාකරණ ව්‍යුහය නැවත ස්ථාපිත කිරීම අනුමත කරන ලදී. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් |

| | | | | | |
|---|---|---|---|---|---|
| ආකාරය පිළිබඳ මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සහ භාර අරමුදලේ සභාපති වෙත දන්වා තිබුණි. | | | | | 2017 දී ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශය සංශෝධනය කරන ලෙසත් නව පරිපාලන ව්‍යුහය ස්ථාපිත කරන ලෙසත් ඉල්ලා කැබිනට් සංදේශයක් ජනාධිපති ලේකම් වෙත උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් දැනටමත් භාර දී ඇත. කැබිනට් අනුමැතිය ලද වහාම ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නියමිතය. ගිණුම් කාරක සභාව විසින් උසස් අධ්‍යාපන ලේකම්වරයා වෙත ශ්‍රී ලංකා තොරතුරු තාක්‍ෂණ ආයතනය සම්බන්ධයෙන් වාර්තාවක් මසක් ඇතුලත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති අතර එම වාර්තාව 2019.08.06 දින ගිණුම් කාරක සභාව වෙත ලබාදී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) 2018 සැප්තැම්බර් 05 දිනැති අංක අමප/18/1873/824/020 දරන කැබිනට් මණ්ඩල තීරණයට අනුව භාර අරමුදල නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ එළඹි ආයෝජන කළමනාකරණ ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ අනුව 2019 පෙබරවාරි 28 දින නැෂනල් වෙල්ත් කෝපරේෂන් විසින් කළමනාකරණය කරන ලද ආයෝජන කළඹ ලංකා බැංකු ආයතනික ශාඛාවේ මහපොළ භාර අරමුදල සතු ප්‍රධාන ගිණුම වෙත මාරු කර තිබුණි. තවද එම කැබිනට් තීරණය අනුව නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඇවර කිරීම හා නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම විකිණීම සිදුකල යුතු වුවත් මෙතෙක් එය සිදුකර නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කල යුතුය. | කටයුතු කරමින් පවතී. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කල යුතුය. | (ඇ) මහපොළ අරමුදල යටතේ පිහිටුවා තිබූ නෙට්වෙල්ත් කෝපරේෂන් සමාගම සහ නෙට්වෙල්ත් සිකියුරිටීස් සමාගම සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 5 දින කැබිනට් මණ්ඩල තීරණය අනුව මහපොළ අරමුදල් ප්‍රධාන අරමුදල ලංකා බැංකුවේ ආයතනික ශාඛාව ගිණුමට 2019 පෙබරවාරි 28 දින පවරන ලද අතර ආයෝජන කළමනාකරණ ගිවිසුම අවසන් කරන ලදී. එම කැබිනට් අනුමැතිය යටතේ නෙට්වෙල්ත් සිකියුරිටීස් සමාගම කොටස් පැවරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින අතර 2019 දෙසැම්බර් වන විට එය අවසන් කලහැකි වේයැයි බලාපොරොත්තු වේ. මේ සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක දී පත්කර ඇත. කෙසේ වෙතත් නෙට්වෙල්ත් සිකියුරිටීස් සමාගම ප්‍රාථමික ගැනුම්කරුවෙකු වශයෙන් වන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව ලබාදී තිබූ බලපත්‍රය 2019 මැයි 31 සිට ක්‍රියාත්මක වන පරිදි මාස 06 ක් තාවකාලිකව අත්හිටුවා ඇති අතර එමනිසා ප්‍රසම්පාදන කටයුතු තරමක් ප්‍රමාදවිය හැකිය. කෙසේ වෙතත් නෙට්වෙල්ත් සිකියුරිටීස් සමාගමේ කොටස් විකිණීමෙන් පසුව නෙට්වෙල්ත් කෝපරේෂන් සමාගම ඇවර කිරීමේ හැකියාව ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම ප්‍රාථමික ගණුදෙනුකරුවෙකු වශයෙන් කටයුතු කිරීම සඳහා මහ බැංකුවෙන් ලද බලපත්‍රය ද සමාගමේ ප්‍රාග්ධනය රු.බිලියන 1ට වඩා අඩුවීම නිසා 2019 මැයි 31 දින සිට නොවැම්බර් 30 දක්වා අත්හිටුවා තිබූ අතර මහපොළ භාර අරමුදල විසින් ලංකා බැංකුවෙන් ලබාගත් රු.බිලියන 4 ක ණය පහසුකමක් යටතේ රු.බිලියන 1.111 ක ණයක් ලබා ගෙන නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගමෙන් භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් 2019 මාර්තු 26 දින මිල දී ගෙන නැවත එය 2019 මාර්තු 27 දින රු.බිලියන 1.113 කට විකුණා තිබූ අතර එම මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර 2019 ජුනි 27 දින එම ණය පියවා තිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කල යුතුය. | නැට්වෙල්ත් සමාගමේ කටයුතු පවත්වා ගෙන යෑම සඳහා මෙසේ සිදු කරන ලදී. | නැට්වෙල්ත් සමාගම සම්බන්ධයෙන් කැබිනට් තීරණ පරිදි කටයුතු කල යුතුය. | මහපොළ අරමුදල යටතේ පිහිටුවා තිබූ නෙට්වෙල්ත් කෝපරේෂන් සමාගම සහ නෙට්වෙල්ත් සිකියුරිටීස් සමාගම සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 5 දින කැබිනට් මණ්ඩල තීරණය අනුව මහපොළ අරමුදල් ප්‍රධාන අරමුදල ලංකා බැංකුවේ ආයතනික ශාඛාව ගිණුමට 2019 පෙබරවාරි 28 දින පවරන ලද අතර ආයෝජන කළමනාකරණ ගිවිසුම අවසන් කරන ලදී. එම කැබිනට් අනුමැතිය යටතේ නෙට්වෙල්ත් සිකියුරිටීස් සමාගම කොටස් පැවරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින අතර 2019 දෙසැම්බර් වන විට එය අවසන් කලහැකි වේයැයි බලාපොරොත්තු වේ. මේ සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක දී පත්කර ඇත. කෙසේ වෙතත් නෙට්වෙල්ත් සිකියුරිටීස් සමාගම ප්‍රාථමික ගැනුම්කරුවෙකු වශයෙන් වන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව ලබාදී තිබූ බලපත්‍රය 2019 මැයි 31 සිට ක්‍රියාත්මක වන පරිදි මාස 06 ක් තාවකාලිකව අත්හිටුවා ඇති අතර එමනිසා ප්‍රසම්පාදන කටයුතු තරමක් ප්‍රමාදවිය හැකිය. කෙසේ වෙතත් නෙට්වෙල්ත් සිකියුරිටීස් සමාගමේ කොටස් විකිණීමෙන් පසුව නෙට්වෙල්ත් කෝපරේෂන් සමාගම ඇවර කිරීමේ හැකියාව ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඉ) භාර අරමුදල් පනතේ 6.2 (අ) (ඇ) (ඈ) වගන්ති අනුව මුදල් සපයා ගැනීම සඳහා දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන ,තෑගී හෝ පරිත්‍යාග භාර ගැනීමට හා ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ලොතරැයි පැවැත්වීමට බලය භාර අරමුදලට ලැබී තිබුණ නමුත් එවැනි මාර්ග වලින් අරමුදල් සපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. විශ්ව විද්‍යාල සිසුන් සඳහා ලබා දෙනු ලබන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වය සඳහා ආරම්භයේ දී සම්පූර්ණ දායකය මහපොළ භාර අරමුදලින් සිදුකළ ද පසුකාලීනව ඉන් සියයට 49 ක දායකත්වයක් රජයෙන් සිදුකර තිබුණි. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කල යුතුය. | ඉදිරියේදී ඒ සම්බන්ධව අවධානය යොමු කෙරේ. | පනතේ සඳහන් ආකාරයට මුදල් උපයාගෙන භාර අරමුදලින් අපේක්ෂිත අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතුය. | මහපොළ භාර අරමුදල් පනතේ විධිවිධාන අනුව කටයුතු කරමින් 2013 වර්ෂයේ නව ලොතරැයි කටයුතු ආරම්භ කර ඇති අතර එම ලොතරැයිකරුවන් එකඟ වූ පරිදි කටයුතු නොකිරීම මත හා එකඟ වූ මුදල් නොගෙවීම මත 2016 වර්ෂයේදී ලොතරැයි පැවැත්වීම නතර කරන ලද අතර ලොතරැයි ගිවිසුම අවලංගු කරන ලදි. මෙම ගිවිසුම අහෝසි කිරීම සම්බන්ධයෙන් ලොතරැයිකරුවන් අධිකරණ නියෝගයක් ලබා ගන්නා ලද අතර ගිවිසුම් ප්‍රකාරව බේරුම්කරණය සඳහා යොමු කරන ලදී. මෙය 2019 නොවැම්බර් වනවිටත් එය අවසන් නොවූ අතර නව ලොතරැයි ආරම්භ කිරීම දැනට තාවකාලිකව අත්හිටුවා ඇත. මහපොළ අරමුදල වෙත දේශීය හා විදේශීය මූලාශ්‍රවලින් පරිත්‍යාග ලබා ගැනීම සඳහා අවශ්‍ය සෘජු බැංකු ගෙවීම් ක්‍රමය යටතේ මුදල් ලබා ගැනීම සඳහා අනුමැතියක් ලබා ගැනීමට භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ කටයුතු කරමින් පවතී. එහි ප්‍රථම පියවර වශයෙන් දැනට මහපොළ වෙබ් අඩවිය නිර්මාණය කර ඇති අතර එය 2019 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක කරනු ලැබේ.<br>මහපොළ ශිෂ්‍යත්ව වාරික මුදල වැඩි කිරීම සම්බන්ධයෙන් මහපොළ අරමුදලේ ආදායම් තත්වය අනුව 2015 වර්ෂයේ රු.400/- කින් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | වැඩිකල අතර 2019 අයවැය යෝජනාවක් මගින් මහා භාණ්ඩාගාරයේ දායකත්වය රු.2,100/- කින් ඉහළ නංවන ලදී. එම වැඩි කිරීම රජයේ අරමුදල් වලින් සිදුකල බැවින් ඒ සම්බන්ධයෙන් මහපොළ අරමුදලට කටයුතු කල නොහැකි. එම හේතුව නිසා රජයේ දායකත්වය රු.350/- සිට රු.2,450/- දක්වා ඉහළ ගිය බැවින් දායකත්ව ප්‍රතිශතය 49% ක් විය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සෑම ප්‍රසම්පාදන අස්ථිත්වයක් විසින්ම ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කළ යුතු අතර එහි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | 2020 සිට ඉදිරි වර්ෂ 3 ක් සඳහා මහපොළ අරමුදලේ ප්‍රසම්පාදන කටයුතුවලට අදාලව සැලැස්මක් සකස් කරමින් පවතින අතර 2020 අයවැය සමඟ භාර අරමුදලේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. | මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ ප්‍රසම්පාදන කටයුතු සලකා බැලීමේදී එදිනෙදා කටයුතු සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා අනෙකුත් මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු හැරෙන්නට ඉතා විශාල ප්‍රසම්පාදන කටයුතු සිදු නොවන අතර මෙහෙයුම් කටයුතුවලට අදාල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් සැලැස්මක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ |

| | | | | | |
|---|---|---|---|---|---|
| සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් භාර අරමුදල විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | | | බලාපොරොත්තු වේ. | | සංග්‍රහයේ 4.2 වගන්තිය අනුව සිදු කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) ව්‍යාපෘති උපදේශකයෙකු විසින් සකස් කළ රු.850,000 ක ඇස්තමේන්තුවකට අනුව අභ්‍යන්තර දුරකථන 30කින් යුත් පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර සුදුසු ම සැපයුම්කරුව තෝරා ගැනීමෙන් පසු ව එය අවලංගු කර දුරකථන 10කින් යුත් පද්ධතියක් ස්ථාපිත කිරීමට වෙනත් සැපයුම්කරුවන්ගෙන් නැවත මිල ගණන් කැඳවා තිබුණි. ඒ අනුව රු.231,804 ක් වූ අවම මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවකු තෝරා ගෙන තිබුණි. මෙහි දී අවශ්‍යතා නිවැරදි ව හඳුනා ගැනීමකින් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | පළමුව ඩිකියුබ් නෙට්වර්ක් සොලියුෂන් දුරකථන සමාගම තෝරා ගන්නා ලද්දේ දුරකථන 30 ක් මිලදී ගැනීමට වූ අතර එම ප්‍රමාණය දැනට අරමුදලේ කටයුතු සඳහා අවශ්‍ය නොවන බව නිරීක්ෂණය වූ බැවින් දුරකථන 10 ක් මිලදී ගැනීම සඳහා නැවත මිල ගණන් කැඳවා ලංකා බෙල් සොලියුෂන් සමාගම තෝරා ගන්නා ලදී. එහිදී භාර අරමුදලට රු.500,000 ක් පමණ ඉතිරි වී ඇත. | අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන මිල ගණන් කැඳවීමට කටයුතු කල යුතු වේ. | ඉදිරියේ දී මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල අවශ්‍ය මිලදී ගැනීම් සම්බන්ධයෙන් නිතරම විශේෂඥ දැනුම ඇති අයෙකුගෙන් අදාල ඇස්තමේන්තු ලබා ගැනීමට කටයුතු කරන අදාල ප්‍රසම්පාදන ඒ අනුව සැලසුම් කරනු ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8.(අ) වගන්තිය ප්‍රකාරව වැඩ සඳහා වූ යම් කොන්ත්‍රාත්තුවකදී, කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම උල්ලංඝනය කලහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා, ඇස්තමේන්තු වටිනාකමින් 5%කට නොඅඩු මුදලක් කාර්ය සාධන සුරක්ෂණය වශයෙන් තබාගත යුතු වුවත් අභ්‍යන්තර ඇමතුම් පද්ධතිය ස්ථාපිත කිරීමේ දී හා ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා වෙබ් පද්ධතියක් ස්ථාපිත කිරීමේ දී කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට භාර අරමුදල කටයුතු කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය | මෙම ප්‍රසම්පාදන කටයුත්ත විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සිදුකල අතර එයට අදාල ගිවිසුම හා අනෙකුත් සියලුම දැ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සිදුකරන ලදී. මේ සම්බන්ධයෙන් මහපොළ එකඟතාවය වූයේ පළමුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ගෙවීම සිදු කිරීමටත් මුළු වියදමෙන් 50% කොටසක් මහපොළ ශිෂ්‍යත්ව අරමුදල දැරීමටත් වශයෙනි. ඒ අනුව භාර අරමුදල මෙම ප්‍රසම්පාදන කටයත්ත සඳහා කාර්ය සාධන සුරක්ෂණය ලබා ගැනීමේ අවශ්‍යතාවය ඇති නොවුණි. | යම් කොන්ත්‍රාත්තුවක දී කොන්ත්‍රාත්කරු ගිවිසුම උල්ලංඝනය කළහොත් අරමුදල ආරක්ෂා කර ගැනීම සඳහා කාර්යයසාධන සුරක්ෂණයක් තබා ගත යුතු වේ. | මහපොළ අරමුදලේ කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී නිතරම කාර්ය සාධන ඇපකරයක් තබා ගැනීම කටයුතු කොට ඇත. |

3. 3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්යමණ්ඩලය 26 ක් වුවත් සත්‍ය කාර්යමණ්ඩලය 14 ක් වූයෙන් තනතුරු 12 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් තෘතිය මට්ටමේ තනතුරු 06 ක්ද ද්විතිය මට්ටමේ තනතුරු 03 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක්ද පුරප්පාඩුව පැවතිණි. එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාකර නොතිබුණි. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | ඉදිරියේදී නව බඳවා ගැනීම් සඳහා කටයුතු කරනු ලැබේ. | ආයතනයේ කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | මහපොළ අරමුදලේ පවතින සේවක පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට නිරතුරුව කටයුතු කොට ඇති අතර ඉතා කුඩා කාර්ය මණ්ඩලයක් වන බැවින් හා සෘජුවම රජයේ ආයතනයක් නොවන බැවින් රජය විසින් ලබාදෙන යම් යම් ප්‍රතිලාභ අරමුදලේ සේවයන්හට ලබාදීමට හැකියාවක් නොමැති හෙයින් කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී යම් අපහසුතා ඇතිවේ. කෙසේ වෙතත් 2018 වර්ෂයේ රජයේ කළමනාකරණ විභාගයේ ප්‍රතිඵල මත සේවකයන් 8 ක් බඳවා ගැනීමට කටයුතු කල අතර ඔවුන්ගෙන් එක් අයෙකු පමණක් පත්වීම භාර ගත් අතර අනෙක් සියලු දෙනාම රජයේ කළමනාකරණ රැකියා ලැබීම නිසා පත්වීම භාරගෙන නොමැත 2019 වර්ෂයේදී සහකාර කළමනාකරුවන් දෙදෙනෙකු සහ අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට කටයුතු කරන අතර ද්විතික මට්ටමේ තනතුරු 06 ක් සඳහා ද කළමනාකරණ සහකාරවරුන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
| --- | --- | --- | --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2019 ජූලි 31 දිනදීය. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය | ඉදිරි වර්ෂවල දී නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කිරීමට සියලු කටයුතු යොදා ඇත. |

## 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| 2014 - 2017 දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් ඉන් පසු කාල පරිච්ඡේද සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | ඉදිරියේදී ඒ පිළිබඳ කටයුතු කිරීමට අදහස් කෙරේ. | ඉලක්ක ප්‍රමාණාත්මකව හා මූල්‍යමය වශයෙන් දක්වා සැලසුම් පිළියෙළ කළ යුතුය. | 2020/25 සංයුක්ත සැලැස්ම සකස් කොට 2019 දෙසැම්බර් භාරකාර මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත. |



## 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 අනුව සංයුක්ත සැලැස්ම පදනම් කර ගත් ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර නොතිබුණි. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | ඉදිරි වර්ෂ සඳහා සකස් කරනු ලැබේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුයි. | ඉහත සංයුක්ත සැලැස්ම අනුමත කල වහාම 2020 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම. |

## 4.4 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
| --- | --- | --- | --- | --- | --- |
| 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අරමුදලේ ගනුදෙනු හා ක්‍රියාකාරීත්වය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු අතර එම ඒකකය විසින් ද විගණනයක් සිදු කර නොතිබුණි. | පවත්නා | පද්ධතිය හඳුන්වා දිය යුතුය | ඉදිරියේදී අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය | මහපොළ අරමුදලේ අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර විගණකවරයෙකු හා කාර්ය මණ්ඩල බඳවා ගැනීමට මහපොළ අරමුදලේ අනුමැතිය ලැබී ඇති බැවින් අවශ්‍ය පියවර ගනිමින් පවතින අතර 2019 අවසන් වන විට එම බඳවා ගැනීම් අවසන් කොට අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කිරීමට හැකිවනු ඇත. |

4.5 විගණන කමිටුව
------------------------

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් 2ක් පැවැත්වූ අතර ඊට රජයේ විගණක කැඳවා නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | ඉදිරි රැස්වීම්වල දී ඒ සම්බන්ධව කටයුතු කරනු ලැබේ. | විගණන හා කළමනාකාර කමිටු රැස්වීම්වල නිරීක්ෂකයෙකු ලෙස රජයේ විගණක කැඳවිය යුතුය. | මහපොළ අරමුදලේ විගණන හා කළමනාකරණ කමිටුව රැස්වීම සඳහා ඉදිරියේ දී නිරීක්‍ෂකයෙකු ලෙස රජයේ විගණනකවරයා කැඳවීමට නියමිතය. |

4.6 අයවැය පාලනය
---------------------

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| 2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 අනුව වාර්ෂික අයවැය පිළියෙල කල වුවත් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය පිළියෙල කර නොතිබුණි. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | ඉදිරි වර්ෂය සඳහා පිළියෙල කර ඇත. | සෑම වර්ෂයන් සඳහා වාර්ෂික අයවැය පිළියෙල කල යුතුය. | මහපොළ අරමුදල සඳහා 2018, 2019 වර්ෂවලට අදාල අයවැය පිළියෙල කොට මහපොළ භාරකාර මණ්ඩලය විසින් ඒවා සම්මත කොට ඇත. එම සම්මත කරන ලද අයවැය අනුව ඉදිරි වර්ෂයේ වියදම් සිදුකොට ඇති අතර මෙම සියලුම අනුමත අයවැය විගණනය සඳහා ඉදිරිපත් කොට ඇත. |